1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

ISO 9001 · ISO/IEC 17021 QMS-001-01

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/07/01/03 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.07. 21 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 02/2024 (i)**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**රජයට සිදුවන හානි හෝ පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 02/2024 අනුව ක්‍රියාකිරීම හා මේ වන විට කටයුතු කර නොමැති හානි හා පාඩු සම්බන්ධ කටයුතු අවසන් කිරීම**

රජයට සිදුවන හානි හෝ පාඩුවීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳව සඳහන් කරමින් භාණ්ඩාගාර ලේකම් විසින් 2024.05.29 දිනැතිව නිකුත් කර ඇති, **"1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන සංශෝධනය කිරීම - මු.රෙ.104 සහ මු.රෙ.108"** යන ශීර්ෂයෙන් යුත් රාජ්‍ය මුදල් (චක්‍රලේඛ) 02/2024 හි සඳහන් කරුණුවලට සමගාමීව 2024.12.10 දිනැතිව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 02/2024 හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ 06 ඡේදයෙහි (iv) අනු ඡේදය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු බව මෙයින් දන්වමි.

> (iv) මේ වන විට කටයුතු කර නොමැති හානි හා පාඩු සම්බන්ධ සියලු කටයුතු 2024.12.31 දිනට ප්‍රථම අවසන් කිරීමට පියවර ගත යුතු ය. ඒ අනුව, ඉදිරියේ දී ඉහත **06. (i)** යටතේ සලකා බැලිය හැකි හානි හා පාඩු හැර වර්ෂ දෙකකට වඩා පැරණි හානි හා පාඩු කපා හැරීම සඳහා වන ඉල්ලීම් පළාත් භාණ්ඩාගාරය වෙත යොමු නොකිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධරයින් වග බලා ගත යුතු වේ.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍ය. වි. දෙපාර්තමේන්තුව, දකුණු පළාත. - දැ.ගැ.පි.

**දුරකථන : 091-49 44 007** **ෆැක්ස් : 091-22 32 691** **විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com**


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"